# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477669 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| නිකුත් කළේ | සන්නිවේදන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2024.03.28 |


## කො.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය 2024 මාර්තු මාසයේ දී තියුණු ලෙස පහළ ගියේය.

කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (කො.පා.මි.ද., 2021=100)[1] වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2024 පෙබරවාරි මාසයේ වාර්තා වූ සියයට 5.9හි සිට 2024 මාර්තු මාසයේ දී සියයට 0.9 දක්වා තියුණු ලෙස පහළ ගියේය. මතුපිට උද්ධමනයේ මෙම පහළ යෑම, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරන ලද පුරෝකථනයන්ට බොහෝ දුරට අනුකූල වේ.

| උද්ධමනය කො.පා.මි.ද., (2021=100) | 2024 පෙබරවාරි | 2024 මාර්තු |
|---|---|---|
| දර්ශක අගය | 200.6 | 196.7 |
| මාසික වෙනස (%) | -0.05 | -1.94 |
| වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය (%) | 5.9 | 0.9 |

සටහන: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට අනුව වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය සහ මාසික වෙනස, වටයන ලද දර්ශකාංක භාවිතා කර ගණනය කර ඇත.

**කො.පා.මි.ද. (2021=100) මාසික ප්‍රතිශත වෙනස සඳහා දායකත්වය**




ආහාර නොවන කාණ්ඩය 2024 පෙබරවාරි මාසයේ වාර්තා කළ සියයට 7.0ක වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනයට සාපේක්ෂව 2024 මාර්තු මාසයේ දී සියයට 0.5ක අවධමනයක් වාර්තා කළේය. කෙසේ වුවද, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ආහාර උද්ධමනය 2024 පෙබරවාරි මාසයේ පැවති සියයට 3.5හි සිට 2024 මාර්තු මාසයේ දී සියයට 3.8 දක්වා ඉහළ ගියේය. ආහාර කාණ්ඩයේ අයිතමවල වාර්තා වූ සියයට 0.66ක මිල පහළ යෑම් සහ ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල වාර්තා වූ සියයට 1.28ක මිල පහළ යෑම් හේතුවෙන් 2024 මාර්තු මාසයේ දී කො.පා.මි. දර්ශකයේ මාසික වෙනස සියයට -1.94ක් ලෙස වාර්තා විය. තවද, ආර්ථිකයේ යටිදැරි උද්ධමන ප්‍රවණතා පිළිබිඹු කරන වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත මූලික උද්ධමනය, 2024 පෙබරවාරි මාසයේ පැවති සියයට 2.8හි සිට 2024 මාර්තු මාසයේ දී සියයට 3.1 දක්වා ඉහළ ගියේය.

ඇතැම් අවස්ථාවන්හීදී යම් විචලනයන් සිදුවිය හැකි වුවද, උද්ධමනය ඉදිරි කාල සීමාව තුළ දී ඉලක්කගත මට්ටමට ළඟා වී, සුදුසු ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල සහාය ඇතිව, මැදිකාලීනව උද්ධමන ඉලක්කය ආසන්නයේ පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**මතුපිට උද්ධමනයේ පුරෝකථන(අ)**
**කොළඹ පාරිභෝගික මිල දර්ශකය,(ආ) කාර්තුමය සාමාන්‍යය, වාර්ෂික ලක්ෂ්‍යමය, %**




උද්ධමන ව්‍යාප්ති සටහන (Fan chart) මගින් මූලික පුරෝකථන පථය වටා පවතින අවිනිශ්චිතතාව ක්‍රමයෙන් වර්ණය අඩු වන පරිදි වූ විශ්‍රම්භ පරාස භාවිත කිරීමෙන් විදහා දැක්වේ. පවත්නා දේශීය හා ගෝලීය ආර්ථික අවිනිශ්චිතතා සහ භූ-දේශපාලනික අර්බුද මධ්‍යයේ වත්මන් පුරෝකථන හා සම්බන්ධ අවිනිශ්චිත බව සාමාන්‍ය කාලයන්ට වඩා ඉහළ වේ. පුරෝකථන සඳහා ඍජුව හෝ වක්‍රව භාවිතා වන විවිධ සාධක ඒවායේ දැනට සලකා ඇති මට්ටම් වලින් අපගමනය වීමේ හැකියාව සහ කිසියම් අනපේක්ෂිත වර්ධන හේතුවෙන් මෙම අවිනිශ්චිතතා හට ගනී. විශේෂයෙන්, මෙම අවිනිශ්චිතතා මධ්‍යයේ ගෝලීය ආහාර සහ බලශක්ති මිල ඉහළ යෑමට ඇති හැකියාව, ඇති විය හැකි අයහපත් කාලගුණ තත්ත්ව හේතුවෙන් කෘෂිකාර්මික නිෂ්පාදනයට සිදුවන බලපෑම හා එමගින් ආහාර උද්ධමනයේ ඇති විය හැකි ඉහළ යෑම, මීළඟ සංශෝධනයේදී විදුලි ගාස්තු ඉහළ නැංවීමට ඇති හැකියාව, වැඩි වැටුප් සඳහා ඇති ඉල්ලුම සාක්ෂාත් වීමට ඇති හැකියාවයනාදී සාධක මගින් උද්ධමනය පුරෝකථනය කරන ලද මට්ටම් වලට වඩා ඉහළ යෑමට බලපෑම් ඇති කළ හැකිය. මේ අතර, පුරෝකථන සඳහා පහළ යෑමේ අවදානම් සැලකූවිට, සැපයුම් තත්ත්වයන් ඉක්මනින් යථා තත්ත්වයට පත්වීම සහ මහජනතාවගේ මිලදී ගැනීමේ ශක්තිය හීන වීමේ බලපෑම ඇතුළත් වේ.

***මූලය:*** *ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල පුරෝකථන*

(අ) මෙහි පෙන්වා දී ඇති උද්ධමන ව්‍යාප්ති සටහනෙහි දක්වා ඇති පුරෝකථන මගින් 2024 වසරේ මාර්තු මාසයේ පුරෝකථන වාරයේ දී පැවති දත්ත, උපකල්පන හා විනිශ්චයන් පිළිබිඹු කෙරේ.

(ආ) 2022 වසරේ සිව්වන කාර්තුව දක්වා වාර්තා කරන ලද දත්ත කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2013=100, ඍතුමය වශයෙන් ඇතිවන බලපෑම් ඉවත් කරන ලද (seasonally adjusted)) මත පදනම් වන අතර මෙම කාල සීමාවෙන් පසු දත්ත කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2021=100, ඍතුමය වශයෙන් ඇතිවන බලපෑම් ඉවත් කරන ලද) මත පදනම් වේ. එම සියලුම ප්‍රකාශිත දත්ත මත පුරෝකථන පදනම් වේ.

[1] කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2021=100), ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන අතර එමගින් කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික ප්‍රදේශවල කුටුම්බ විසින් මිලදී ගන්නා භාණ්ඩ හා සේවාවල මිලෙහි සාමාන්‍ය වෙනස්වීම් පෙන්නුම් කරනු ලබයි.

## උප කාණ්ඩ අනුව කො.පා.මි.ද. (2021=100) මත පදනම් වූ මතුපිට උද්ධමනය
## (වාර්ෂික ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස)




## කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (2021=100) හැසිරීම

| කාලපරිච්ඡේදය | | දර්ශක අගය | | මාසික % වෙනස | | වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස | | වාර්ෂික සාමාන්‍ය % වෙනස | |
|---|---|---|---|---|---|---|---|---|---|
| වසර | මාසය | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) |
| 2023 | මාර්තු | 195.0 | 171.9 | 2.9 | -0.2 | 50.3 | 39.1 | - | - |
| | අප්‍රේල් | 192.3 | 171.5 | -1.4 | -0.2 | 35.3 | 27.8 | - | - |
| | මැයි | 192.3 | 171.0 | 0.0 | -0.3 | 25.2 | 20.3 | - | - |
| | ජූනි | 192.3 | 169.9 | 0.0 | -0.6 | 12.0 | 9.8 | - | - |
| | ජූලි | 190.2 | 170.4 | -1.1 | 0.3 | 6.3 | 5.9 | - | - |
| | අගෝස්තු | 190.1 | 171.2 | -0.1 | 0.5 | 4.0 | 4.6 | - | - |
| | සැප්තැම්බර් | 191.8 | 172.0 | 0.9 | 0.5 | 1.3 | 1.9 | - | - |
| | ඔක්තෝබර් | 191.4 | 172.4 | -0.2 | 0.2 | 1.5 | 1.2 | - | - |
| | නොවැම්බර් | 193.4 | 172.4 | 1.0 | 0.0 | 3.4 | 0.8 | - | - |
| | දෙසැම්බර් | 195.1 | 172.5 | 0.9 | 0.1 | 4.0 | 0.6 | 17.4 | 14.5 |
| 2024 | ජනවාරි | 200.7 | 176.2 | 2.9 | 2.1 | 6.4 | 2.2 | 14.2 | 11.3 |
| | පෙබරවාරි | 200.6 | 177.2 | 0.0 | 0.6 | 5.9 | 2.8 | 11.3 | 8.5 |
| | මාර්තු | 196.7 | 177.3 | -1.9 | 0.1 | 0.9 | 3.1 | 8.0 | 6.1 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව